# සංස්කෘත උපදේශ සාහිත්‍යයෙන් විද්‍යමාන වන ගැටුම් නිරාකරණය පිළිබඳ සාම්ප්‍රදායික ක්‍රමවේදය (Traditional Theory) පිළිබඳ විමසුමක්

කරඳගොල්ලේ සෝභිත හිමි


## Abstract

According to the conflict resolution theory, by far the traditional theory that had been using for ages was that, defeating powerless by powerful one as conflict resolution, before the advent of the modern theory of conflict resolutions such as

Human Need Theory

Principled Negotiation Theory

Community Relation Theory

Identity Theory

Inter-Cultural Miscommunication Theory

Conflict Transformation Theory

In traditional theory, it has mostly used power or coercive

power to defeat the opposites. The nature of that method is that the authority is used by the powerful party and power against to the opposite party. By using that method, the expected final result is to win and lose. That is, one party gains victory and the other one definitely lose. In that case, it is unable to fulfill requirements and objectives of both the parties as the powerful state or group gains victory while the powerless state or group loses.

According to the Pañcatantra and Hitopadeśa of Sanskrit didactic literature, many conflicts have been found faced by government and human being, and strategies of resolution which had been in use to resolve them in governance and social life. The traditional theory had been used to resolve conflicts in Sanskrit didactic literature. That theory is also the same as above mentioned. Final results of that method is defeating wimp by vigorous. Therefore, through out of this study, it pays attention to reveal traditional theory of conflict resolution depicted in Sanskrit Didactic Literature with an appropriable example.

***Keywords:*** *Sanskrit Didactic Literature, Conflict Resolution, Powerful State, Powerless State, Pañcatantra, Hitopadeśa*

**යතුරු පද :** සංස්කෘත උපදේශ සාහිත්‍යය, ගැටුම් නිරාකරණය ප්‍රබල රාජ්‍යය, දුබල රාජ්‍යය, පඤ්චතන්ත්‍රය, හිතෝපදේශය.

## හැඳින්වීම

ලෝකයේ සිදුවන්නාවූ විවිධ ගැටුම් මඟහරිමින් සාමකාමී නිර්මාණශීලී මනුෂ්‍ය සමාජයක් වඩාත් ස්ථාවර පදනමක් මත ගොඩනැඟීමේ අවශ්‍යතාව ජාත්‍යන්තර ලෝකයට අවශ්‍ය වූ අතර ඒ සඳහා විවිධ උපාය උපක්‍රමයන් පිළිබඳ උනන්දුව යොමුවන්නට විය. එහිලා ගැටුම් නිරාකරණය සඳහා යොදා ගන්නට යෙදුණු සාම්ප්‍රදායික ක්‍රමෝපාය වූයේ රාජ්‍ය මැදිහත්වීමයි (State-Intervention). මෙම රාජ්‍ය මැදිහත්වීමෙන් බහුල වශයෙන් යොදාගනු ලැබ ඇත්තේ බලය නැතහොත් බලපෑම් (Coercive Power) කිරීමයි. මෙම බලය

භාවිතයේදී උනුන්ගේ ප්‍රබලතාව මත ඉතා බරපතල වූ ප්‍රචණ්ඩකාරී හිංසන ක්‍රියාවන් සිදුවෙයි. ඉන් එම පාර්ශ්වකරුවන්ට ජය හෝ පරාජය මෙන්ම මේ දෙකින්ම වියුක්ත වූ ඉතා දීර්ඝකාලයක් පවත්නා හානිදායක ප්‍රතිඵලයන්ට මුහුණදීමට සිදුවෙයි. මෙනිසා ඉතා විධිමත් න්‍යායාත්මක ක්‍රමෝපායයක් ගැටුම් නිරාකරණය සඳහා යොදා ගැනීමට දැරූ ප්‍රයත්නයක් වශයෙන් දෙවන ලෝක යුද්ධයෙන් පසු ගැටුම් නිරාකරණය සම්බන්ධ නූතන ප්‍රවේශයන් ගොඩනඟා ඇත. මෙම න්‍යායන් මඟින් අවධානය යොමු කැර ඇත්තේ ගැටුමට තුඩුදෙන හේතූන් පිළිබඳ ව (Causes of Conflict) සහ ඒවා විසඳීමට අදාළ විවිධ ක්‍රමෝපායයන් පිළිබඳවයි. එම ප්‍රවේශයන් අතර

මානුෂික අවශ්‍යතා න්‍යාය (Human Needs Theory)

ප්‍රතිපත්ති ගරුක ගිවිසගැනීමේ න්‍යාය (Principled Negotiation Theory)

ප්‍රජා සබඳතා න්‍යාය (Community Relation Theory)

අනන්‍යතා න්‍යාය (Identity Theory)

අන්තර් සංස්කෘතික සාවද්‍ය සන්නිවේදන න්‍යාය (Inter-Cultural Miscommunication Theory)

ගැටුම් පරිණාමන න්‍යාය (Conflict Transformation Theory) **(Jayadeva Uyangoda, 2005), (කරුණාදාස, 2003)** යන න්‍යායයන් දක්නට ලැබේ.

ගැටුම්වල ස්වභාවය හා ඒවායේ බාහිර තත්වයන් පිළිබඳ විමසා බැලීමේ දී විවිධ වර්ගීකරණයන් දක්නට ලැබේ. ගැටුම් කෙසේ විසඳා ගන්නේ ද යන්න තීරණය කිරීමේදී නිශ්චිත වශයෙන් ම ගැටුම්වල ස්වභාවය හඳුනාගෙන සිටීම ඉතා වැදගත් සාධකයක් වෙයි. එකිනෙකාගේ පැවැත්මට අභියෝග නොකරන ගැටුම්වලට වඩා එකිනෙකාගේ පැවැත්මට අභියෝග හා තර්ජන එල්ල කරන ගැටුම් බොහෝ ප්‍රචණ්ඩකාරී වන්නාසේම නිරාකරණය කිරීම අපහසු වන්නක් බව නූතන විද්වතුන්ගේ මතයයි. ඒ අනුව ගැටුම් ඇතිවීමට හේතුවන්නා වූ මූලබීජයන්ට අනුකූලව ගැටුම් ප්‍රධාන කොටස් තුනකින් යුක්තව විස්තර කෙරේ. ඒවා පිළිවෙළින්

අයිතිය මත සිදුවන ගැටුම් (භූමි ප්‍රදේශ හෝ සම්පත් හා සම්බන්ධිත ගැටුම්),

සාරධර්ම මත සිදුවන ගැටුම් (ආගම, දේශපාලන මතවාදය හා ජනවාර්ගිකත්වය මත පදනම් වන ගැටුම්) හා

සම්බන්ධතා මත සිදුවන ගැටුම් (බහුතරය හා සුළුතරය අතර ගැටුම් හා පාලක පන්තිය හා පාලිත පන්තිය අතර ඇතිවන ගැටුම්) යනුවෙන් හඳුනාගත හැකිවෙයි **(සමරනායක, 2003: 15).**

එමෙන්ම නූතන වර්ගීකරණයන්ට අනුව ගැටුම් පිළිබඳ දක්වා ඇති ප්‍රභේද කිහිපයක් පහත දැක්වේ.

ක්ෂුද්‍ර ගැටුම්- (Micro Conflicts)

විශාල ගැටුම්- (Macro Conflicts)

අන්තර් රාජ්‍ය ගැටුම්- (Inter state Conflicts)

අන්තර්රාජ්‍ය නොවන ගැටුම්- (Non inter State Conflicts)

සමමිතික ගැටුම්- (Symmetric Conflicts)

අසමමිතික ගැටුම්- (Asymmetric Conflicts)

**(කරුණාදාස, 2003: 52-54)**

තත් වර්ගීකරණයට අදාළව, රටක හෝ සමාජයක ඇතිවන්නා වූ ගැටුම් එහි ස්වභාවයට හා ස්වරූපයට අනුව උක්ත කවරම වූ හෝ වර්ගයකට අයත් වන බව හඳුනාගත හැකිවෙයි. උපදේශ සාහිත්‍යයේ දක්නට ලැබෙන ගැටුම් ද උක්ත වර්ගීකරණයන්ට අනුයුක්ත කොට දැක්විය හැකි වෙයි. ඒ අනුව **පඤ්චතන්ත්‍රයේ** හා **හිතෝපදේශයේ** දක්නට ඇති කතා මගින් ඉදිරිපත් කරන සිද්ධි හා අවස්ථාවන් පිළිබඳ විමසීමේ දී එහි ගෙනහැර දක්වන ගැටුම් සිදුවන අවස්ථාවන් කිහිපයක් දැකිය හැකිය.

රාජ්‍යයන් අතර ඇතිවන ගැටුම්

අන්තර් රාජ්‍ය නොවන ගැටුම්

මානසික වශයෙන් පුද්ගලයන් තුළ ඇතිවන ගැටුම්

ආදි ගැටුම් අවස්ථාවල උක්ත ලක්ෂණයන් හඳුනාගත හැකි වෙයි. විශේෂයෙන් මෙම ගැටුම් පැනනැගී ඇති හේතු කාරණා පිළිබඳ විමසා බලන විට එකිනෙකට වෙනස් වන තම අභිමතාර්ථයන් ඉටුකර ගැනීමට යාමේ ප්‍රතිඵලයක් වශයෙන් සමුත්පන්න වූ ඒවා බව හඳුනාගත හැකිවෙයි. එමෙන්ම **පඤ්චතන්ත්‍රයේ** කාකෝලූකීය කාණ්ඩයේ සඳහන් පරිදි ඇතැම් පුද්ගල කණ්ඩායම් අතර ඇති වන්නාවූ ගැටුම් ජන්මයෙන් ජන්මයට ගමන් කරන සනාතන ගැටුම් වශයෙන් ද හඳුනාගත හැකිය. උපදේශ සාහිත්‍යයේ මෙම ගැටුම් නිරාකරණයේ දී බොහෝ කොට භාවිත කොට ඇත්තේ සාම්ප්‍රදායික ගැටුම් නිරාකරණ ක්‍රමවේදය හෙවත් බලවතා විසින් දුබලයා පරාජයට පත් කිරීමේ ක්‍රමවේදයයි. ඒ අනුව සාම්ප්‍රදායික ගැටුම් නිරාකරණ ක්‍රමවේදය උපදේශ සාහිත්‍යයේ භාවිත වී ඇති ආකාරය පිළිබඳ විවරණය කිරීම මෙම විමර්ශනාත්මක අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ.

## පර්යේෂණ ගැටලුව

ගැටුම් නිරාකරණය හා සම්බන්ධ සංස්කෘත උපදේශ සාහිත්‍යාගත සාම්ප්‍රදායික ක්‍රමවේදය භාවිත වී ඇති අකාරය නිර්ණය කිරීම.

## පර්යේෂණ අරමුණු

උපදේශ සාහිත්‍යාගත ගැටුම් පිළිබඳ හඳුනා ගැනීම.

ගැටුම් නිරාකරණය පිළිබඳ සංස්කෘත උපදේශ සාහිත්‍යාගත සාම්ප්‍රදායික ප්‍රවේශයෙහි ස්වභාවය හඳුනාගැනීම.

## පර්යේෂණ වැදගත්කම

සංස්කෘත උපදේශ සාහිත්‍යය මුල්කොට විවිධ අධ්‍යයනයන් කරනු ලැබුව ද එහි අන්තර්ගත ගැටුම් නිරාකරණ ප්‍රවේශයන්හි ඇති වැදගත්කම පිළිබඳ මැනවින් කරන ලද විවරණයන් දක්නට නොමැති තරම්ය. විවිධ කථාන්දර හා පාඨ වශයෙන් දක්නට ලැබෙන එම ප්‍රවේශයන් මඟින් ගත හැකි ප්‍රයෝජන ඉතා සුවිශාල වෙයි. විශේෂයෙන් එහි අන්තර්ගත කථාන්දරවල හා පාඨයන්හි ගැටුම් නිරාකරණය සම්බන්ධ ප්‍රවේශයන් දක්නට ලැබුණ ද ඒ පිළිබඳ කරනු ලබන සාරගර්භ වූ විග්‍රහයන් ඉතා අල්ප වෙයි. රාජ්‍ය පාලනය පිළිබඳ උපදේශයන් ලබාදෙන්නා වූ ග්‍රන්ථයන් වශයෙන් උපදේශ සාහිත්‍යයෙක

ගැටුම් නිරාකරණයෙහිලා සාම්ප්‍රදායික ක්‍රමවේදය භාවිත වී ඇති ආකාරය අවබෝධ කර ගැනීමෙහිලා ඒ පිළිබඳ අධ්‍යයනය කරනු ලබන විද්‍යාර්ථීන්ට මෙම විමර්ශනය මහත් පිටුබලයක් වේ.

## පර්යේෂණ සීමා

මෙම පර්යේෂණයේදී සංස්කෘත උපදේශාගත ගැටුම් නිරාකරණය පිළිබඳ සාම්ප්‍රදායික ප්‍රවේශය නිර්ණය කිරීමෙහිලා විෂ්ණුශර්මන් පඬිවරයාගේ **පඤ්චතන්ත්‍රය** හා නාරායණ ශර්මන් පඬිවරයාගේ **හිතෝපදේශය** යන ග්‍රන්ථ ද්වය පරිශීලනය කිරීමට අපේක්ෂා කරන අතර එම පුරාතන කෘතීන්හි අන්තර්ගත න්‍යායයන් හා ප්‍රයෝගයන් විමර්ශනයට භාජනය කෙරේ. පුළුල් ක්ෂේත්‍රයකින් යුත් උපදේශ සාහිත්‍යයේ සන්නිවේශිත **පඤ්චතන්ත්‍රයෙහි** හා **හිතෝපදේශයෙහි** පුද්ගලාවබද්ධ මෙන්ම රාජ්‍ය පාලනතන්ත්‍රය හා සබැඳි ගැටුම් සහ එම ගැටුම් නිරාකරණයෙහිලා සාම්ප්‍රදායික ක්‍රමවේදය භාවිත කොට ඇති ආකාරය දක්නට ලැබෙන නිසා සීමාවන් වශයෙන් සන්නිදර්ශිතවේ. එහිලා උක්ත කෘති සඳහා M.R.Kale මහතා විසින් සංස්කරණය කරන ලද මූලපාඨ ඇතුළත් ග්‍රන්ථ භාවිත කෙරේ. එමෙන්ම අවශ්‍ය අවස්ථාවන්හි නූතන ගැටුම් නිරාකරණ ප්‍රවේශයන් අධ්‍යයනයේදී මූලික වශයෙන් Jayadeva Uyangoda සහ ඩබ්ලිව්.එම්. කරුණාදාස ආදීන් විසින් රචනා කර ඇති ගැටුම් නිරාකරණ ප්‍රවේශ හා සබැඳි කෘති මෙන්ම තදනුබද්ධ වෙනත් ග්‍රන්ථයන් ද භාවිත කෙරේ.

## සාහිත්‍ය විමර්ශන

රාජ්‍ය පාලනය පිළිබඳ අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයීම සඳහා රචිත ග්‍රන්ථයන් වශයෙන් **පඤ්චතන්ත්‍රය** හා **හිතෝපදේශ** යන කෘතීන්හි අන්තර්ගත කථා හා සිදුවීම් මගින් කථා රසය හා එම කථා ගෙනහැර දක්වන උපදේශය පිළිබඳව පමණක් අවධානය යොමු කර ඇතත් ඒවායෙන් ඉස්මතු කර දක්වන වෙනත් විෂයක්ෂේත්‍රයන් පිළිබඳ ගැඹුරු අවධානයක් හෝ අධ්‍යයනයන් සිදු කිරීමට උත්සුක නොවීම හේතුවෙන් හුදු උපදේශාත්මක කථා සංග්‍රහයන් වශයෙන් පමණක් ජනප්‍රියත්වයට පත්ව ඇත. විශේෂයෙන් තත් ග්‍රන්ථයන්ගෙන් විශද වන ගැටුම් නිරාකරණ ක්‍රමවේදයන් පිළිබඳ පෙර'පර දෙදිග වියතුන් විසින් සිදුකර ඇති අධ්‍යයනයන් සොයා ගැනීම උගහට ය.

## පර්යේෂණ ක්‍රමවේදය

සංස්කෘත උපදේශ සාහිත්‍යයේ එන විෂ්ණුශර්මන්ගේ **පඤ්චතන්ත්‍රය** හා නාරායණශර්මන්ගේ **හිතෝපදේශය** යන කෘතීන් සඳහා ලියැවී ඇති අටුවා, පරිවර්තන හා වෙනත් විස්තරකථනයන් සමන්වා බලා ඒවායේ අන්තර්ගත ගැටුම් නිරාකරණය පිළිබඳ සාම්ප්‍රදායික ප්‍රවේශය නිර්ණය කිරීමට අපේක්ෂිතය. මෙහි දී උක්ත උපදේශ කෘති හා නූතන ගැටුම් නිරාකරණ ප්‍රවේශයන් සබැඳිව සිංහල, ඉංග්‍රීසි, ආදි භාෂාවන්ගෙන් ලිය වී ඇති ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කෙරේ.

## උපන්‍යාසය

**පඤ්චතන්ත්‍රයේ** හා **හිතෝපදේශයේ** ලක්ෂිත කථාවන්ට හා සිද්ධීන්ට අනුව රාජ්‍යයන් හා පුද්ගල කණ්ඩායම් අතර ඇති වන ගැටුම් නිරාකරණයේදී නිරාකරණ ක්‍රමවේදය වශයෙන් ප්‍රබලයා විසින් දුබලයා ජය ගැනීමේ සාම්ප්‍රදායික ක්‍රමවේදය බහුලව භාවිත කොට ඇත.

## සාකච්ඡාව හා ප්‍රතිඵල

නීති ශාස්ත්‍රය හෙවත් රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් උපදෙස් ලබාදෙන ග්‍රන්ථයන් වශයෙන් **පඤ්චතන්ත්‍රයේ** සහ **හිතෝපදේශයේ** අන්තර්ගත කතා පිළිබඳ විමසීමේදී කතා බොහෝමයකින් ගෙනහැර දක්වන්නේ සාම්ප්‍රදායික ක්‍රමවේදය භාවිත කරමින් ගැටුම් නිරාකරණය කිරීමට කරන ලද ප්‍රයත්නයන්ය. **පඤ්චතන්ත්‍රයේ** මිත්‍රභේද තන්ත්‍රයේත් **හිතෝපදේශයේ** සුහෘද්භේද කාණ්ඩයේත් දැක්වෙන පිංගලක නම් සිංහයා සහ සංජීවක නම් වෘෂභයා අතර සිදුවන ගැටුම බලසම්පන්න පාර්ශ්වය විසින් දුබල පාර්ශ්වය පරාජයට පත්කිරීම පිළිබඳ උදාහරණ සපයන්නකි. එම කතාවට අනුව පිංගලක සහ සංජීවක දෙදෙනා බොහෝ කාලයක් මිතුරන් වශයෙන් කටයුතු කරති. මේ අතර ඔවුන්ගේ මිත්‍රත්වය නිසා තමන්ට ලැබෙන වරප්‍රසාද අහිමි වූ කරටක හා දමනක නම් සිවලුන් දෙදෙනා විසින් කේලාම් කියා පිංගලක හා සංජීවක දෙදෙනා භේද කරන ලදි. එයින් පසු දෙදෙනා අතර සැකය ඇතිවෙයි. සංජීවක තමන් විනාශකොට සිහසුන හිමිකරගැනීමට උත්සාහ දරන බව පිංගලක නම් සිංහයා කල්පනා කරන අතර පිංගලක සිංහයා තමන් මරණයට පත්කර සිය පිරිවරට ආහාර පිණිස දීමට සූදානම්

වන බව සංජීවක කල්පනා කරයි. මෙම වැරදි වැටහීම හේතුවෙන් ඇතිවන ගැටුමෙන් සංජීවක මරණයට පත්වෙයි **(Pañcatantra of Viṣṇuśarman, मित्रभेदम्, 1969: 1-90), (Hitopadeśa of Nārāyaṇa, सुहृद्भेदः,1967: 32-61)**. විශේෂයෙන් මෙම ගැටුමෙන් පිංගලක හා සංජීවක දෙදෙනාටම තම අභිමතාර්ථයන් මුදුන්පත් කරගැනීමට අවස්ථාව නොසැලසෙයි. එනිසා සිදුවන්නේ බලවත් වූ සිංහයා විසින් දුබල වූ වෘෂභයා පරාජයට පත්කිරීමයි.

එමෙන්ම **පඤ්චතන්ත්‍රයේ** කාකෝලූකීය තන්ත්‍රයේ සඳහන් ආකාරයට මේඝවර්ණ නම් කවුඩු රාජයා සහ අරිමර්දන නම් බකමූහුණු රාජයා අතර ඇති වූ ගැටුමෙන් බකමූහුණු රජු ඇතුළු පිරිස පරාජයට පත්වෙයි. එම කතාව සැකවින් මෙසේය.

''දක්ෂිණ දේශයේ මහ නගරයක් ඇත. ඒ නගරයට සමීපයෙහි විශාල නුග රුකක විශාල පිරිවර ඇති මේඝවර්ණ නැමති කවුඩු රජෙක් විය. සහජයෙන්ම ප්‍රතිමල්ලවයෙකු වූ අරිමර්දන නම් බකමූහුණු රජෙක් ද මීට නුදුරු ගල් ගුහාවක වෙසෙයි. හෙතෙමේ ද මහත් පිරිවර ඇත්තෙකි. මොහු කපුටන් කෙරෙහි වෛර වූයේ දුටු දුටු තැන ඔවුන් අල්ලා මරයි. ටික කලකින් නුග ගස හාත්පස කවුඩු අස්ථිවලින් පිරී ගියේය. දිනක් මේඝවර්ණ රජතෙමේ තම මන්ත්‍රී මණ්ඩලයේ උජ්ජීවි, සංජීවි, අනුජීවි, ප්‍රජීවි හා චිරංජීවි යන මන්ත්‍රීවරුන්ගෙන් සතුරා මැඬීමට උපාය සෙවීය.

ඒ අනුව පිළිවෙළින් උජ්ජීවි තෙමේ 'අපේ සතුරා බලවත් බැවින් සටනට නොයා ඔහු හා සමාදානයෙන් පැවැත්විය යුතු බව ද ''සංජීවි තෙමේ ''උජ්ජීවිගේ අදහසට එකඟ නොවී සතුරා කෲර නම්, තෘෂ්ණාභරිත නම්, ප්‍රතිපත්ති රහිත නම් සමාදානයෙන් නොපැවැත්විය යුතු යැයි ද, අනුජීවි තෙමේ ''සතුරා කපටිය. බලසම්පන්නය. යුක්තියට ගරු නොකරයි. එහෙයින් ඔහු සමඟ සමාදානයක් නොපැවැත්විය යුතුය. යුද්ධයෙහි ද නොයෙදිය යුතුය. බල කඳවුර පමණක් වෙනස් කළ යුතු යැයි ද, ප්‍රජීවි තෙමේ ''යුද්ධය හෝ සමාදානය හෝ මගෙන් අනුමත නොවන්නේ යැයි ද, චිරංජීවි තෙමේ ''සයවැදෑරුම් යුද්ධ තන්ත්‍රය අතුරෙන් සංග්‍රහයට මම කැමැත්තෙමි. ප්‍රබල සතුරාගෙන් විපතක් එළඹ සිටි කල එයින් ආත්මාරක්ෂාව සලසා ගැනීම සඳහා ප්‍රබල වූ හෝ නොවූ මිතුරෙකු සහායට ගැනීමෙන් මෙහිදී සංග්‍රහ

තන්ත්‍රය යෙදවිය යුතු බව ද යනුවෙන් ඔවුනොවුන්ගේ අදහස් දැක්වූ අතර මේඝවර්ණ කවුඩු රජතෙමේ ඔවුන්ට ස්තුති කොට සැමට වඩා යුද්ධ තන්ත්‍රයත්, යුද්ධෝපායත් ගැන මහත් අවබෝධයක් ඇති මහාප්‍රාඥ, වෘද්ධ, උපශාන්ත ස්ථිරජීවි නම් කවුඩාට හිස නමා ආචාර කොට මෙහිදී අනුගමනය කළ යුතු අයුරු පහදන්නැයි ඇයදීය. පෙර මන්ත්‍රීවරුන් විසින් ඒ ඒ අවස්ථාවට අනුරූප අංග දැක්වූ බවත් මේ එළඹ ඇති අවස්ථාවට වඩා සුදුසු වන්නේ ද්වෛධී භාවය මිස අනෙකක් නොවන බවත් හෙතෙම කීවේය. තව ද, සමාදාන ප්‍රයත්නයකින් සතුරාගේ විශ්වාසය දිනාගෙන අවස්ථාව බලා මර්මස්ථානයට පහරදීම එයින් අදහස් වන බව හෙතෙම වැඩිදුරටත් දැක්වීය. **(Pañcatantra of Viṣṇuśarman, काकोलूकीयम्,1967:134-145),** (මහානාම හිමි, **2011**: ප්‍රස්තාවනාව **xxv-xxvi**).

එයිනික්බිති ස්ථිරජීවිගේ උපදෙස් මත මේඝවර්ණ තෙමේ ස්ථිරජීවිත් සමඟ දරුණු කලහයක් ඇති කරගෙන ඔහුට බරපතල තුවාල සිදුකොට වාසස්ථානය කරගෙන සිටි ගසෙන් බිමට දමා සිය පිරිසත් සමඟ වෙනත් ස්ථානයකට ගමන් කරයි. මෙම කලහය බලාගෙන සිටි අරිමර්දන නම් බකමුහුණු රජුගේ චරපුරුෂයා එම සිද්ධිය පිළිබඳ ඔහුව දැනුවත් කරයි. එය ඇසූ බකමුහුණු රජතෙමේ ඇඳිරි වැටී තිබෙනු දැක පලායන සතුරු කපුටන්ට පහරදීම සඳහා පිටත් වන ලෙස සිය සේනාවට දැන්වීය. රජුගේ අණින් කවුඩන්ට පහරදීම සඳහා ඔවුන් වාසය කළ නුගරුක වෙත ගිය ද එහි එකදු කපුටෙක් නොවීය. වටපිට සොයා බලා සියලු සතුරන් විනාශ කරන ලෙස අරිමර්දන තම සේනාවට අණ කළේය. මෙම අවස්ථාවේ ස්ථිරජීවි නම් කපුටා ද ගස මුල වැටී සිටියේ තමන් එහි සිටින බව ඇඟවීමට ශබ්ද කළේය. බකමුහුණන් ඔහු නැසීමට එතැනට පැමිණි පසු තමන්ට බකමුහුණු රජුට ඉතා වැදගත් තොරතුරු රැසක් පැවසීමට ඇති බව පවසන ලදුව බකමුහුණු රජු එතැනට පිවිසියේය. එතැනට පිවිසි රජතෙමේ මේ කුමක් වූයේ දැයි විමසූ විට ''මේඝවර්ණයා ඊයේ නුඹගේ බලදුර්ගය ආක්‍රමණය කිරීමට සූදානම් වන වේලාවේ අප දුර්වල යයි ද ඔබ වහන්සේ බලසම්පන්න යයි ද එනිසා ආක්‍රමණය නොකරන්න යැයි පැවසූ හෙයින් මා ඔබ වහන්සේගේ චරපුරුෂයෙකු යැයි කියා මෙලෙස හිරිහැර කොට පලාගිය බවත් දැන් තමන්ට ඇත්තේ බකමුහුණු රජුගේ

සරණ බවත් මේඝවර්ණයාගෙන් පළිගත යුතු අතර ඒ සඳහා ඔහුගේ බලදුර්ගය ඔබවහන්සේට පෙන්වන්නෙමි යැයි ද පැවසීය.'' මෙයින් පසු බකමුහුණු රජු තම ප්‍රධාන අනුශාසකවරුන් ගෙන්වා ස්ථිරජීවි නම් මහලු කවුඩාට කුමක් කළ යුතුදැයි විමසීය. එහිදී රක්තාක්ෂී නම් මහලු බකමුහුණා 'මොහු අප වංශයේ පරම සතුරෙකි. කල්පනා නොකොට වහාම මරා දමන ලෙස දැන්වීය.' නමුත් ක්‍රූරාක්ෂ, දීප්තාක්ෂ, වක්‍රනාස හා ප්‍රාකාරකර්ණ යන මන්ත්‍රීවරුන් ඔහුගෙන් ප්‍රයෝජන ඇති හෙයින් ඔහුට අවශ්‍ය පහසුකම් සපයා ඔහු රැකගත යුතු බව පැවසීය. නමුත් රක්තාක්ෂි තෙමේ තරයේ කියා සිටියේ ඔහුව විනාශ කළයුතු බවයි. එයට අවනත නොවූ අරිමර්දන තෙමේ ස්ථිරජීවිට අවශ්‍ය පහසුකම් සපයයි. එයින් කලකිරුණු රක්තාක්ෂී තෙමේ ඉදිරියේ විශාල කරදරයක් වන බව දැන තම පිරිස සමඟ බලදුර්ගයෙන් නික්මෙයි. ස්ථිරජීවි ද තම සැලසුමට අනුව බලදුර්ගයේ දොරටුව සමීපයේ වාසය කිරීමට අවශ්‍ය පහසුකම් සපයන ලෙස දන්වයි. ඒ අනුවම කටයුතු සිදුවන අතර ස්ථිරජීවි තෙමේ ද එහි සිට කුඩුවක් තනාගැනීමේ ව්‍යාජයෙන් විශාල දර කෝටු ආදියෙන් කොටු දොරකඩ අවහිර කළේය. ඉන්පසු බකමුහුණන් නිදා හුන් කල මේඝවර්ණ වෙත ගොස් ''දේවයන් වහන්ස, සතුරු බලදුර්ගය විනාශ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කළේය. ගිනිහුල බැගින් ගත් සේනාවක් සමඟ වහා එහි එනුමැනවි. මා විසින් බලදුර්ගයේ දොරකඩ ගොඩගසා ඇති දරගොඩට ගිනි ඇවිලුණු කල සතුරු මුළ සමූල ඝාතනය වන්නේ යැයි'' පැවසීය. මේඝ වර්ණ ද ගිනිහුල බැගින් ගත් සිය පිරිවර සමඟ ගොස් බලදුර්ගයේ දොරකඩ ගොඩ ගසා තිබූ දර ගොඩට ගිනි තැබුවේය. දිවා සමයේ අන්ධව නිද්‍රාවෙන් සිටි සකල බකමුහුණු ගණයාම රක්තාක්ෂිගේ අවවාදය නොපිළිගැනීම ගැන පසුතැවිලි වෙමින් පිලිස්සී විනාශයට පත්වූහ. **(Pañcatantra of Viṣṇuśarman,काकोलूकीयम्, 1967:155-170)**.

උක්ත කතාවෙන් ද ගම්‍ය වන්නේ තීක්ෂණ බුද්ධියෙන් හා කපටිකමින් යුක්ත බලවත් රාජ්‍යය, පුද්ගල කණ්ඩායම හෝ පුද්ගලයා තම ප්‍රතිමල්ලවයා වන දුබල රාජ්‍යය, පුද්ගල කණ්ඩායම හෝ පුද්ගලයා පරාජයට පත්කොට ජයග්‍රහණය අත්පත් කරගන්නා ආකාරයයි. එයින් සිදුවන්නේ එක් පාර්ශ්වයක අභිමතාර්ථයන් මුදුන් පත්වීමත් අනෙක් පාර්ශ්වයේ අභිමතාර්ථයන් හා අභිලාෂයන් විනාශයට පත්වීමත් සිදුවී

එක් කණ්ඩායමක් ජයග්‍රහණය කොට අනෙක් කණ්ඩායම පරාජයට පත්වීමයි.

එමෙන්ම **හිතෝපදේශයේ** විග්‍රහ කාණ්ඩයේ සංලක්ෂිත චිත්‍රවර්ණ නම් මොණර රජු ඇතුළු පිරිසත් හිරණ්‍යගර්භ නම් හංසරාජයා ඇතුළු පිරිසත් අතර ඇතිවන ගැටුම ද උක්ත න්‍යාය නිරූපණය කරන හා ප්‍රත්‍යක්ෂ කර දක්වන කදිම අවස්ථාවකි. එහි සඳහන් පරිදි,

''කර්පූර දිවයිනෙහි පද්මකෙලි නම් විලක් ඇත. එහි ජලයෙහි හැසිරෙන සියලු පක්ෂීන් විසින් එකතු වී කුරුලු රාජ්‍යයෙහි අභිෂේක කරන ලද හිරණ්‍යගර්භ නම් රාජහංසයෙක් වාසය කරයි. එක් දිනක් ඒ රාජහංස තෙම ඉතා පුලුල් පියුම් නැමති සිංහාසනයෙහි පිරිවර විසින් පිරිවරණ ලදුව සුවසේ හිඳගෙන සිටින විට කිසියම් දිශාවක සිට පැමිණි දීර්ඝ මුඛ නම් කොකෙක් රජුට වැඳ හුන්නේය. රජු ඔහුගෙන් අන් දේශයක සිට පැමිණියෙහිදැයි විමසා එහි තොරතුරු පවසන ලෙස කීවේය. එහිදී එම කොකා ජම්බුද්වීපයෙහි වින්ධ්‍යා නම් පර්වතයක් ඇති බවත් එහි චිත්‍රවර්ණ නැමති පක්ෂීන්ට රජ වූ මොනරෙකු වාසය කරන බවත් පැවසීය. එමෙන්ම එම රජුගේ සේවක වූ ඇවිදින්නා වූ පක්ෂීන් විසින් දග්ධ නැමති වනයෙහි දී තමන් දැක තොරතුරු විමසූ බවත් එහිදි තමන් කර්පූර ද්වීපයෙහි රාජචක්‍රවර්ති හිරණ්‍යගර්භ නම් හංස රජතුමාගේ සේවකයෙක් බවත් කුහුලින් අන් දේශයක් බැලීමට පැමිණි බව ඔවුන්ට පැවසූ බව රජුට දැන්වීය. එමෙන්ම එම පක්ෂීන් විසින් මේ දේශයන් දෙකෙන් කුමන දේශය උසස් දැයි විමසූ විට 'කර්පූර දේශය දෙව්ලොවින් එක් දෙසක් බවත් එහි රජු දෙවනි ශක්‍රයෙකු බදු බවත් මේ වැලිතලාවේ වැටුණා වූ නුඹලා ද එහි පැමිණෙව් යැයි' පැවසූ බවත් රජුට දැන්වීය. එය අසා කෝප වූ එම පක්ෂීන් තමන් චිත්‍රවර්ණ නම් මොනර රජු වෙත රැගෙන ගොස් තම දේශයට පැමිණි මොහු මෙරටට සහ රජුට නින්දා කරන බව පවසා සුදුස්සක් කිරීමට රජුට ඉදිරිපත් කළ අතර එහිදී එම රජතුමා තම තොරතුරු විමසා මෙම රාජ්‍යය ද තමන්ගේ රාජ්‍යයට යටත් බව එහි සිටි පක්ෂීන් විසින් පැවසූ හෙයින් චිත්‍රවර්ණ රජු සමඟ සටනකට සූදානම් වන ලෙස සිය රජුට දන්වන ලෙස පවසා තමන් පිටත්කර එවූ බවත් එය පැවසීමට චිත්‍රවර්ණ රජතුමාගේ දූතයෙකු වන

ගිරවෙක් මග පැමිණෙන බවත් වහ වහා සුදුසු කටයුත්තකට සූදානම් වියයුතු බවත් දීර්ඝ මුඛ නම් කොකා වැඩිදුරටත් හිරණ්‍යගර්භ හංස රජුට දැන්වීය.

එය ඇසූ හිරණ්‍යගර්භ හංස රජුගේ ප්‍රධාන මන්ත්‍රියෙක් වූ සක්වාලිහිණි තෙම සිනාසී රජතුමනි, කොකා අන්‍ය දේශයකට ගොස් ශක්ති පමණින් රාජකාරිය කරන ලද්දේය. නමුත් මෝඩකම නිසා විවාද කරන්නට ගොස් කලහයක් ඇති කරගත්තේය. එය මෝඩයාගේ ලක්ෂණය යයි ද මෙය අපගේ සේවකයෙකුගේ මෙහෙයවීමෙන් කොකා විසින් සිදුකරන ලද්දකැයි පැවසීය. එය ඇසූ රජු ඉක්මගිය දෙයට අවමන් කිරීමෙන් පලක් නැති බවත් පැමිණි ඇති කාර්යයට කළ යුතු දෑ කුමක් දැයි විමසීය. එවිට වහාම චිත්‍රවර්ණ රජුගේ කටයුතු පිළියෙල කරන අයුරුත් ශක්තිය හා අශක්තිය දැනගැනීම සඳහාත් චරපුරුෂයෙක් එහි යවන ලෙසත් එයින් පසු සුදුසු ක්‍රියා මාර්ගයක් ගනිමු යැයි ද සක්වාලිහිණි තෙම පැවසීය. මේ අතර චිත්‍රවර්ණ රජුගේ දූතයා වූ ගිරවා පැමිණෙන අතර ඔහු ආගන්තුකයන් රඳවන ස්ථානයේ තබා සෙන්පති වූ විල්ලිහිණියා කැඳවා බලකොටුවක් නිර්මාණය කිරීමට අණ කරයි. මේ අතර ලංකාද්වීපයේ මේඝවර්ණ නම් කවුඩෙක් පැමිණ ඇතැයි රජුට දැනගැනීමට ලැබුණු අතර ඔහු මේ සටන සඳහා සුදුසු අයෙක් බව ද සක්වාලිහිණියාට පවසයි. නමුත් ඔහු විශ්වාස නොකළ යුතු බව සක්වලිහිණි තෙම තරයේ ප්‍රකාශ කර සිටියි. එයින් පසු දූතයා වශයෙන් පැමිණි ගිරවා සහ මේඝවර්ණ නම් කපුටා රාජසභාවට කැඳවන අතර ගිරවා ''ඉදින් ජීවිතයෙන් හෝ රාජ්‍යයෙන් ප්‍රයෝජනයක් ඇත්තේ වී නම් එකල්හි වහා අවුත් අපගේ පා දෙක වඳුව එසේ නොවන්නේ නම් විසීමට අන් තැනක් කල්පනා කරව.'' යනුවෙන් චිත්‍රවර්ණගේ පණිවිඩය රාජහංසයාට පවසයි. එයින් කෝපයට පත් රාජහංසයා මෙම ගිරවා මැරීමට සමතෙකු මෙහි නැත්දැයි විමසන විට මේඝවර්ණ ඒ සඳහා ඉදිරිපත්වෙයි. නමුත් සර්වඥ නම් මන්ත්‍රී තෙම රජු ද කවුඩා ද සනසමින් කරුණු දක්වන අතර ගිරවා රාජ සභාවෙන් නික්ම යයි. සක්වාලිහිණි තෙමේ ගිරවාට පුද පඬුරු ලබාදී පිටත් කර හරියි.

නැවත වින්ධ්‍යා පර්වතයට යන ගිරවාගෙන් චිත්‍රවර්ණ රජු එම දේශය කෙබඳු දැයි විමසූ විට ''සැකෙවින් මේබඳු පුවතක් ඇත. දැන්

යුද්ධ ආරම්භ කරනු ලැබේවා. කර්පූර නම් දේශය දෙව්ලොවින් එක් දෙසකි. රජතෙමේ දෙවෙනි ශක්‍රයෙකි. වර්ණනා කරන්නට කෙසේ නම් හැක්කේ ද'' යැයි පැවසීය. එවිට චිත්‍රවර්ණ රජු මන්ත්‍රී මණ්ඩලය රැස්කරවා කරුණු විමසා දෛවඥයන්ගෙන් සුභ මොහොතක් දැන යුද්ධයට පිටත්ව ගොස් මලය පර්වතයේ කඳවුරු බැඳගත්තේය. හිරණ්‍යගර්භගේ චරපුරුෂයන් මේ බව දන්වන අතර චිත්‍රවර්ණගේ ප්‍රධාන මන්ත්‍රී වූ ගිජුලිහිණියා ඉතා දක්ෂයෙකු බවත් ඔහුගේ කතාවට ඇහුම්කන් දීමෙන් මෙම බලකොටුවේ ඔවුන්ගේ චරපුරුෂයෙකු රඳවා ඇති බවත් වැඩිදුරටත් පැවසීය. මෙම අවස්ථාවේ සක්වාලිහිණි තෙමේ මේඝවර්ණ නම් කවුඩා සැක සහිත බවත් ඔහු වහා බලකොටුවෙන් ඉවත් කළ යුතු බවත් හිරණ්‍යගර්භට ප්‍රකාශ කළ ද ඔහු එයට එකඟ නොවෙයි. මේ අතර සක්වාලිහිණියාගේ උපදෙස් මත ඉක්මන් වී යුද්ධ කිරීමට පැමිණෙන චිත්‍රවර්ණගේ සේනාවට ගිරිදුර්ග තුළදී පහරදී විශාල හානියක් සිදුකිරීමට හිරණ්‍යගර්භට හැකියාව ලැබේ. මෙම ප්‍රහාරයෙන් නැසුණු සෙන්පතියන් හා සේනාව ඇති චිත්‍රවර්ණ තමාගේ ඉක්මන්වීම පිළිබඳ දැඩිසේ කම්පාවෙන අතර ඉතිරි සේනාව රැගෙන ආපසු යාමට සැරසෙයි. නමුත් ගිජුලිහිණියා එයට ඉඩ නොදෙන අතර හිරණ්‍යගර්භගේ බලකොටුවේ ඇති වස්තුව හා සිහසුන ඔහුට ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව පවසා ඔහු සනසයි. එමෙන්ම අදම වහා කොටු දොරටුව ඇවිරීම කරනු ලැබේවායි කීවේය. ඒ පිළිබඳ හිරණ්‍ය ගර්භගේ චරපුරුෂයන් විසින් හිරණ්‍යගර්භව දැනුවත් කරන ලද අතර සක්වාලිහිණි තෙමේ බලසේනාව සුදුසු පරිදි දීම සහ බුහුමන් කිරීමෙන් පෙරදැරි කරන ලෙස උපදෙස් දෙයි.

මේ අතර මේඝවර්ණ නම් කවුඩු තෙම පැමිණ සටන් කරනු කැමති සතුරන් කොටු දොරටුවෙහි සිටින බවත් පිටතට ගොස් සටන් කිරීමට අවසර දෙන ලෙසත් ඉල්ලා සිටියි. එවිට සක්වාලිහිණි තෙම එසේ නොකරන ලෙසත් එසේ කරන්නේ නම් කොටුව පිළියෙල කිරීම නිෂ්ඵල වන බවත් සඳහන් කරයි. අනතුරුව කොටු දොරටුවට ගොස් සියල්ලෝම මහ සටනක් කළහ. පසුදින චිත්‍රවර්ණ රජු ගිජුලිහිණියාට සිය පොරොන්දුව ඉටු කරන ලෙස දැන්වීය. කොටුව ඇල්ලීමට ඔවුනොවුන් බිඳවීම, බොහෝ කල් කොටුව වැටලීම, බලාත්කාරයෙන් යටත් කිරීම, ඉතා තද දරුණු ක්‍රියා දැක්වීම යන සතර උපක්‍රම බවත්

ඒ සඳහා තමන් ශක්ති ප්‍රමාණයෙන් උත්සාහ කරන බව ගිජුලිහිණියා චිත්‍රවර්ණ රජුට දැන්වීය. ඒ අනුව පසුදින හිරු උදානොවූ කල්හි දොරටු සතරෙහි සටන් පැවති කල්හි කොටුව තුළ වූ ගෙයක් පාසා කවුඩන් විසින් එකවිට ගිනිලන ලද්දේය. ඉක්බිති කොටුව ගන්නා ලදැයි ගන්නා ලදැයි යන අරගලය අසා නොයෙක් ගෙවල්හි ද ඇවිල ගත් ගින්න ප්‍රත්‍යක්ෂ වශයෙන් බලා රාජහංසයාගේ කොටුවෙහි වාසී වූ බොහෝ සේනාවෝ වහා විලට පිවිසියාහුය. රාජහංසයා සියුමැලි හෙයින් ලැසි ගමන් ඇත්තේ විල්ලිහිණියා දෙවැනි කොට ගමන් කරන්නේ චිත්‍රවර්ණගේ සෙන්පතියා වූ කුකුළා විසින් වට කරන ලද්දේය. විල්ලිහිණියාට බෙරී යන ලෙසත් චූඩාමණි නම් තම පුත්‍රයා සර්වඥ නම් ඇමතියාගේ සම්මතයෙන් රජ කරන්නේ යැයි. හිරණ්‍යගර්භ රජු පැවසූ නමුත් විල්ලිහිණියා එයට එකඟ නොවෙන අතර තමන් සෙන්පතියා නිසා රජු ආරක්ෂා කිරීම තම වගකීම බව පවසයි. එයිනික්බිති කුකුළා හිරණ්‍යගර්භට පහර දීමට සැරසෙන විට විල්ලිහිණියා විසින් රජතෙම ස්වකීය ශරීරයේ අතරට ගන්නා ලද්දේය. අනතුරුව කුකුළා විසින් නිය මුව තුඩු පහරින් දැදුරු කරන ලද විල්ලිහිණියා විසින් තමාගේ සිරුරින් වසා හිරණ්‍යගර්භ රජතෙමේ ජලයෙහි බහාලන ලද්දේය. කුකුළු තෙමේ ද සේනාපති විල්ලිහිණියා විසින් සිය මුව තුඩින් ඇනීමෙන් කඩ කඩ කොට නසන ලද්දේය. පසුව විල්ලිහිණි තෙමේ ද බොහෝ කුරුල්ලන් විසින් එකතු වී නසන ලද්දේය. චිත්‍රවර්ණ රජු ද කොටුව තුළට පිවිස කොටුවෙහි පැවති ද්‍රව්‍යයන් ගෙන්වාගෙන වන්දිභට්ටයන් විසින් ජය හඬින් සතුටු කරවන ලද්දේ තමන්ගේ කඳවුරට ගියේය.'' **(Hitopadeśa of Nārāyaṇa, विग्रह:, 1967: 61-86), (හල්දොල විමලකිත්ති හිමි, 218-295)**.

උක්ත කතාවේ චිත්‍රවර්ණ නම් මොනර රජු ඇතුළු පිරිසගේත් හිරණ්‍යගර්භ නම් රාජහංසයා ඇතුළු පිරිසගේත් ඒකායන අභිප්‍රාය බවට පත්ව තිබුණේ ඇතිවන යුද්ධයෙන් ජයග්‍රහණය ලබාගැනීමයි. නමුත් දෙපිරිසෙහිම අභිප්‍රායන් එනම් ජය-ජය (Win-Win) **(කරුණාදාස, 2003: 43)** නම් තත්වය ඇති කරගැනීමට නොහැකි විය. සිදුවූයේ බලසම්පන්න පිරිස ජයග්‍රහණය කිරීම සහ දුර්වල වූ පිරිස පරාජයට පත්වීමයි. ඒ අනුව එහි ද දක්නට ලැබෙන්නේ බලවතා විසින් දුබලයා පරාජයට පත්කර ගැටුම නිරාකරණය කරගැනීමේ සාම්ප්‍රදායික ගැටුම්

නිරාකරණ ක්‍රමවේදයයි.

**සමාලෝචනය**

උක්ත තොරතුරුවලට අනුව සංස්කෘත උපදේශ සාහිත්‍යාගත **පඤ්චතන්ත්‍රය** හා **හිතෝපදේශය** යන කෘතීන්හි අන්තර්ගත කථා සහ සිද්ධීන් මගින් රාජ්‍යයන් හා පුද්ගල කණ්ඩායම් අතර විවිධ අභිමතාර්ථයන් සම්පූර්ණ කර ගැනීමට ගන්නා වූ උත්සාහයන්හිදී ගැටුම් හටගෙන ඇති ආකාරයත් එම ගැටුම් නිරාකරණයෙහිලා සාම්ප්‍රදායික ක්‍රමවේදය භාවිත කර ඇති ආකාරයත් හඳුනාගත හැකි වේ. එහි ප්‍රතිඵල වී ඇත්තේ බලවත් පාර්ශ්වය විසින් දුර්වල පාර්ශ්වය පරාජයට පත් කොට තම අභිමතාර්ථ සඵල කර ගැනීමයි. වත්මන් කාලයේ ද විවිධ රටවල් හා පුද්ගල කණ්ඩායම් අතර ඇති වන්නා වූ ගැටුම් පිළිබඳ විමසා බැලීමේදී ද දැකිය හැකි වන්නේ බලවත් රාජ්‍යය හෝ පුද්ගල කණ්ඩායම් දුබල රාජ්‍යය හෝ පුද්ගල කණ්ඩායම් විවිධ උපක්‍රම යොදා මැඩපවත්වමින් සිය අපේක්ෂා හා අභිමතාර්ථයන් සඵල කරගැනීමට උත්සාහ කරන ආකාරයයි. ඒ අනුව බලවතා විසින් දුබලයා මැඩලීමේ සාම්ප්‍රදායික ගැටුම් නිරාකරණ ක්‍රමවේදය සාර්වකාලික වූ සාර්වභෞමික වූ ක්‍රමවේදයක් බවද හඳුනාගත හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Kale, M.R. (ed.), (1967), **Hitopadeśa of Nārāyaṇa**. (Bombay: Gopal Narayana & Co.

Kale, M.R. (ed.), (1969), **Pañcatantra of Viṣṇuśarman.** Delhi: Motilal Banarsidass.

**පඤ්චතන්ත්‍රයග** (ශ්‍රී සුමංගල අභිනව ව්‍යාඛ්‍යාව, මිත්‍රභේද කථා සංග්‍රහය), 1990) (පරි.) පහමුණේ ශ්‍රී සුමංගල හිමි, කොළඹ: සමයවර්ධන.

**පඤ්චතන්ත්‍රයේ කාකොලූකීයල.** (2011), (පරි.), මිනුවන්ගමුවේ මහානාම හිමි, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

**පඤ්චතන්ත්‍රය. 2002,** (පරි.), හේමපාල මුණිදාස, කොළඹ: ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

**හිතෝපදේශය.** (පරි.), හල්දොල විමලකිත්ති හිමි, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

කරුණාදාස, ඩබ්ලිව්.එම්. (2003), **ගැටුම් නිරාකරණයට හැඳින්වීමක්.** දෙහිවල: ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ.

Uyangoda, Jayadeva. (eds.), (2005), **Conflict, Conflict Resolution and Peace Building: An Introdution to Theories and Practices.** Colombo: Department of Political Science and Public Policy and IMCAP of University of Colombo.

සමරනායක, ගාමිණී. 'සමාජ ගැටුම් නිර්වචනය සහ ස්වභාවය', (2003), රංජිත් දික්වැල්ල, රේණුක ප්‍රියන්ත, ශිරානි හෙට්ටිආරච්චි, (සංස්.), **ගැටුම් නිරාකරණ න්‍යාය සහ භාවිතය.** වරකපොල: ආරිය ප්‍රකාශකයෝ.